# රුසියාවේ බෞද්ධ රාජ්‍යය කල්මිකියාව යි

පී.ඒ. රුවන් කුමාර

The republic of Kalmyki is located in the European continent. It is situated in the lower valley of the Volga river in Eastern Europe. Kalmyki republic which belongs to the Russian Federation is ruled by a Buddhist President. This is the Only Buddhist region in Europe. Kirsan Ilyumzhinov is the President of this country. The population of this country is approximately 350,000. The Buddhist population of the country is marked as 45%. In 4th of November 1920, Kalmyki was granted sovereignty by the Russian Central Council.

---

© පී.ඒ. රුවන් කුමාර

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

කල්මිකියාව නැගෙනහිර යුරෝපයේ වොල්ගා නදියේ පහළ මිටියාවතේ තිබෙන රටකි. කැස්පියන් මුහුදේ වයඹ දිග වෙරළ කල්මිකියාවේ එක් සීමාවකි. කල්මිකියා ජනරජය රුසියා ෆෙඩරේෂනයට අයත් අතර බෞද්ධ ජනාධිපති කෙනකු යටතේ පාලනය වේ. මෙය යුරෝපයේ ඇති එක ම බෞද්ධ රාජ්‍යය වේ. ලෝකයේ බොහෝ රටවල බෞද්ධයෝ සිටිති. ඔවුන් අතරින් බොහෝ දෙනා ආසියාතික බෞද්ධ රටවලින් සංක්‍රමණය වූවෝ ය. සෙසු පිරිස බුදු දහම ගැන පැහැදී ඒ අනුව ජීවත් වන අය වෙති. අතීතයේ දී යුරෝපය දක්වා බොහෝ රටවල පැතිර තිබුණු බුද්ධාගම හා බෞද්ධ ශිෂ්ටාචාරය ජනවාර්ගික ආක්‍රමණ හේතුවෙන් විනාශ විය. ඒ නිසා වර්තමානයේ දී බුද්ධාගම සැලැකෙන්නේ ආසියා රටවලට සීමා වුණු ආගමක් වශයෙනි. නමුත් බෞද්ධ ජනාධිපතිවරයකු විසින් පාලනය කරනු ලබන බෞද්ධ රාජ්‍යයක් ඇත. ඒ කල්මිකියා ජනරජය යි.

කිර්සාන් නිකොලයවිච් ඉසුම්සිනොව් ඒ රටෙහි ජනාධිපතිවරයා ය. කල්මිකියා ජාතික කොඩියේ තිබෙන්නේ කහ පසුබිමක අඳින ලද සුදු පියුමකි. එය යොදාගෙන ඇත්තේ බෞද්ධ සංකේතයක් වන බැවිනි.

එහි ජනගහනය තුන් ලක්ෂ පනස් දහසක් පමණ වේ. එයින් සියයට 45ක් පමණ බෞද්ධයෝ ය. එහි ක්‍රිස්තියානි ජනගහනය සියයට එකකි. ඇමෙරිකාවට සංක්‍රමණය වූ කල්මික් පවුලකින් පැවැත එන එර්ඩ්නි ඔම්බඩිකොව්තුමා කල්මිකියාවේ බෞද්ධ ආගමික නායකයා ය. එතුමා කල්මිකියාවට පැමිණියේ 1992 වසරේ දී ය. දෙ මාපියන් විසින් ළමා වියේ දී ම ඉන්දියාවේ ධර්ම පාඨශාලාවකට යවන ලද එර්ඩ්න් ඔම්බඩිකොව්තුමා බුදු දහම හැදෑරුවේ දලයිලාමාතුමා ඇසුරෙනි. ටිබෙට් බෞද්ධ උතුමකු වූ තිලෝපා ලාමාතුමාගේ පුනර්ජන්මය යැ යි විශ්වාස කරන නිසා එතුමා හැඳින්වෙන්නේ තෙලෝ රින්පොෂේ යන ගෞරව නාමයෙනි.

කල්මිකියාවේ තිබෙන්නේ කහ හිස් වැසුම් පලඳින තිබ්බත ගෙලුප්සා බෞද්ධ සම්ප්‍රදායය යි. කල්මික්වරුන්ගේ පාරම්පරික විශ්වාස ද බුද්ධාගමට සම්බන්ධ කර තිබේ. එයින් ප්‍රධාන තැනක්

ගන්නේ විශ්වය ආරක්‍ෂා කරන දෙවියන් වශයෙන් ඔවුන්ගේ මුතුන් මිත්තන් විසින් අදහන ලද වයස්ගත සුදු මිනිසාගේ පිළිරුවට බෞද්ධ දෙවියකු ලෙස සලකා පුද පූජා පැවැත්වීම යි. කල්මික් බෞද්ධයෝ මැයි මාසයේ දී මහලු සුදු දෙවියා වෙනුවෙන් උත්සව පවත්වති.

දේශ සීමා ව්‍යාප්ත කරගැනීමට නිතර ම වෙහෙසුණ රුසියාවේ සාර් පාලනයෙන් කල්මිකියාවට වරින් වර තර්ජන එල්ල වුණි. ඒ අතර ජර්මන් ගෝත්‍රිකයන්ගේ ආක්‍රමණවලට මුහුණ දෙන්නට ද කල්මික්වරුනට සිදු වුණි. ඒ නිසා ඔවුහු සිය වාසභූමි අත හැර මධ්‍ය ආසියාව දෙසට සංක්‍රමණය වූ හ. ඒ අවස්ථාවල ඔවුන්ගේ බොහෝ පිරිසක් සා පිපාසාවෙන් මරණයට පත් වූ හ. තවත් පිරිසක් කිර්ගීස් හා කෂාක් ගෝත්‍රික කොල්ලකකරුවන් විසින් මරා දමන ලද හ. තම රටෙන් පැන නො ගිය කල්මික්වරු රුසියා පාලනය යටතේ ජීවත් වූ හ. කල්මිකියාවේ වර්තමාන අගනුවර වන එලිස්ටා නගරය ඔවුන් විසින් 1956 දී සකස් කරගන්නා ලද වාස භූමියකි.

1917 රුසියා විප්ලවයේ දී රුසියා රජයේ හමුදාවට එක් වුණු කල්මික්වරු ජෙනරාල් ඩෙන්කින් හා ව්‍රන්ගල් යටතේ රතු හමුදාවට එරෙහි ව යුද වැදුණ හ. එහෙත් රතු හමුදාව ජය ලබමින් ඉදිරියට ඇදෙන විට රට අත හැර පලා යාමට ඔවුනට සිදු වුණි. සරණාගතයන් බවට පත් වූ ඔවුහු බෙල්ග්‍රේඩ්, ප්‍රාග්, පැරීසිය, ප්‍රංශයේ ලියොන්, බල්ගේරියාව වැනි යුරෝපයේ නොයෙක් පෙදෙස්වල කණ්ඩායම් වශයෙන් පදිංචි වූ හ. පැරැණි රුසියා පාලනය යටතේ සනාතන පල්ලිය විසින් කල්මික්වරුන් සුළු පිරිසක් කිතු දහමට හරවාගනු ලැබුවත් බහුතර පිරිස බුද්ධාගම අත හැරියේ නැත.

සරණාගතයන් ලෙස යුරෝපයේ පදිංචි වූ කල්මික්වරු තම පාරම්පරික බෞද්ධ උරුමය රැකගත් හ. ඔවුන්ගෙන් පිරිසක් 1929 දී බෙල්ග්‍රේඩ් නගරයේ පන්සලක් තැනූ හ. ඒ අනුව මධ්‍යම යුරෝපයේ මුල් වරට පන්සලක් ඉදිකිරීමේ ගෞරවය කල්මික් බෞද්ධයනට හිමි වෙයි. බෞද්ධ විහාර පාර නමින් බෙල්ග්‍රේඩ් නගරයේ වීදියක් නම් කර තිබිණි.

කල්මික්වරුන් රතු හමුදාවට බැඳුණ හොත් ස්වාධීන ව ජීවත් වීම සඳහා ප්‍රමාණවත් ප්‍රදේශයක් ඔවුන්ට වෙන් කරදෙන බව ලෙනින් පොරොන්දු වී ඇත. ජාතින්ට ස්වයං නීර්ණ අයිතිය ලබාදීමේ ප්‍රතිපත්තිය අනුව රුසියානු කොමියුනිස්ට් මධ්‍යම කාරක සභාව විසින් 1920 නොවැම්බර් 04 වැනි දින කල්මිකියාව රුසියාවට අයත් ස්වාධීන පාලන ප්‍රදේශයක් වශයෙන් පිළිගන්නා ලදි. එහෙත් දැඩි මතධාරි කොමියුනිස්ට්වාදීන් එයට කැමැත්ත දක්වා නොමැත. මොස්කව් බල අධිකාරියෙන් කල්මිකියාවේ පාලන බලය ගිලිහීම අහිතකර බව ඔවුන්ගේ අදහස විය. කල්මික් පාසල් ගුරුවරයකු වූ දොර්ෂා අර්බකොව් ඔවුන්ගේ මතයට එරෙහි ව සටන් කළ කෙනෙකි. බෞද්ධයන්ගේ හා බෞද්ධ ලෝකයේ සිත් දිනාගැනීමට සෝවියට් බලධාරිනට අවශ්‍ය නම්, ලේ වැගිරීමකින් තොර ව කල්මික්වරුන්ට ස්වයං තීරණ අයිතිය ලබාදිය යුතු යැ යි ඔහු පැවසී ය. ඒ හේතුවෙන් කල්මික් බෞද්ධයන් ජාතිවාදී, කොමියුනිස්ට් විරෝධී පිරිසකැ යි සලකා කටයුතු කරන ලදි.

කල්මික් බෞද්ධයන් දැඩි ලෙස පීඩා වින්දේ සෝවියට් දේශයේ ජෝශප් ස්ටාලින්ගේ පාලන සමයේ දී ය. එකල කල්මිකියාවේ විහාරස්ථාන සියයකට අධික ප්‍රමාණයක් තිබුණු අතර එහි වැඩ සිටි භික්ෂු සංඛ්‍යාව අනුමාන වශයෙන් තුන් දහසකි. ජෝෂප් ස්ටාලින්ගේ නියෝගය අකුරට ම ක්‍රියාත්මක කෙරුණු නිසා භික්ෂූන් හා බෞද්ධ නායකයන් විශාල පිරිසකට කල්මිකියාවේ ජීවත් වීමේ අයිතිය අහිමි විය. කල්මික්වරුන් ඒ නිදහස භුක්ති වින්දේ මාස කිහිපයකි. රතු හමුදාව විසින් නැවතත් කල්මිකියාව අත් පත් කර ගනු ලැබිණි. කල්මික්වරුන් ජර්මන් හමුදාවට සහයෝගය දැක්වීම ද්‍රෝහී ක්‍රියාවකැ යි තීරණය කළ රුසියානු බලධාරීහු 1943 දෙසැම්බර් 27 වැනි දින ඔවුන් ඒ ප්‍රදේශයෙන් නෙරපා හැරීමට නියෝග කළ හ. එයින් බියට පත් කල්මික්වරු දහස් ගණනක් දරු පවුල් රැගෙන ජර්මන් හමුදාව සමඟ පලා ගිය හ. කරත්තවල පටවා රටින් පිටුවාහල් කළ තවත් පිරිසක් සයිබීරියාවට යන ගමනේ දී ආහාර පාන නොමැති ව මිය ගිය හ. කොමියුනිස්ට් පාලන සමයේ දී නොයෙක් පෙදෙස්වලට විසිර ගිය කල්මික්වරුනට මවු බිමට පැමිණීමේ වාසනාව යළිත් උදා වුණේ නිකිතා කෘෂෙෆ් රුසියාවේ පාලකයා බවට පත් වීමෙන්

පසු ව ය. කල්මික්වරුනට මවු බිමට පැමිණීමට ඔහු 1957 දී අවසර දුන්නේ ය. කල්මිකියාව රුසියාවට අයත් ස්වතන්ත්‍ර ජනරජයක් වශයෙන් 1992 මාර්තු 31 වැනි දින ප්‍රකාශයට පත් කෙරුණි. 1993 අප්‍රේල් මස කල්මිකියාවේ ප්‍රථම ජනාධිපති ලෙස තේරී පත් වුණු කිර්සාන් නිකොලයාවිච් ඉලුම්ෂිනොව් තෙ වැනි වරටත් ඒ තනතුර උසුලයි.

විවිධ දුක් පීඩාවලට ගොදුරු වූ කල්මිකියා රාජ්‍යයේ යළිත් බුදු දහමේ ආලෝකය පැතිරෙන්නට පටන් ගත්තේ ජනාධිපති කිර්සාන් නිකොලයවිච්ගේ දැඩි ඇප කැපවීම හේතුවෙනි. 1962 අප්‍රේල් දෙ වැනි දින උපන් කිර්සාන් කල්මිකියානුවෙකි. මොස්කව් විශ්වවිද්‍යාලයයෙන් ජපන් ඉතිහාසය, ව්‍යාපාර කළමනාකරණය හා ජාත්‍යන්තර සබඳතා යන විෂය හදාරා ඇති ඔහු සතු මූල්‍ය සමාගම් හා ව්‍යාපාර ගණන පනහකට අධික ය. ඔහුගේ වත්කම් ඩොලර් බිලියන ගණනකි. සුඛෝපභෝගී මෝටර් රථ හා පෞද්ගලික ගුවන් යානා ඔහු සතු ය. 1990 දී කිර්සාන් දේශපාලනයට පිවිසියේ කල්මිකියා ජනරජය වෙනුවෙන් රුසියා පාර්ලිමේන්තුවේ පෙනී සිටින නියෝජිතයා වශයෙනි. ඔහුගේ පාලනය යටතේ කල්මිකියාව විශාල දියුණුවක් ලබා ඇත. බලයට පත් ව කෙටි කලකින් ඔහු හැම නිවසකට ම ගෑස් පයිප්ප හා ජලය ලබාදීමටත්, මං මාවත් ඉදි කිරීමටත් පියවර ගත්තේ ය. ජනාධිපති කිර්සාන් තම මවු බිමේ හා රට වැසියන්ගේ යහපත සඳහා ඩොලර් බිලියන ගණනක් වැය කළේ තමන්ගේ පෞද්ගලික ධනයෙනි.

ජනාධිපති කිර්සාන් ලෝක චෙස් ක්‍රීඩා සංවිධානයේ සභාපතිවරයා ය. චෙස් ක්‍රීඩාව කල්මිකියාවේ ප්‍රධාන ආදායම් මාර්ගයක් කරගැනීමේ අරමුණ ඇති ව දැවැන්ත සැලැස්මක් ක්‍රියාත්මක වෙයි. ඒ අනුව ලෝකයේ එක ම චෙස් ක්‍රීඩා නගරය එහි ඉදි කර තිබේ. ලොව බොහෝ රටවල චෙස් ක්‍රීඩා ලෝලීහු කල්මිකියාවට පැමිණෙති. චෙස් ක්‍රීඩාව අනිවාර්ය පාසල් විෂයයක් බැවින් පිට්ටනිවල විශාල චෙස් ක්‍රීඩා එලක පිහිටුවා තිබේ. නිකරුණේ කල් ගෙවන්නන් හා මත් ද්‍රව්‍යවලට පුරුදු වී සිටි තරුණ පිරිස් චෙස් ක්‍රීඩාව නිසා විනය ගරුක ව හැසිරෙන්නටත්, තර්කානුකූල ව හිතන්නටත් දැන් හුරු වී සිටින බව ජනාධිපති කිර්සාන් පවසයි. ඒ නිසා රටේ අර්බුද හා නීති විරෝධී ක්‍රියා අඩු වී ඇත. චෙස් යනු

සංස්කෘත භාෂාවේ 'චතුරංග' යන්නෙන් සෑදුණු වචනයකි. අතීතයේ දී චෙස් ඉත්තන් ලෙස භාවිත කළ බෝසත්වරුන්ගේ රූප මොංගෝලියාවෙන් හමු වී ඇත. කිර්සාන් ජනාධිපති සිතන පරිදි චෙස් ක්‍රීඩාව මිනිසුන් යහ මඟට යොමු කරන ආගමකට සමාන ය.

කිර්සාන් ජනාධිපති තනතුරට පත් වන විට කල්මිකියාවේ එක් පන්සලක් හෝ නො තිබුණි. එහෙත් දැන් එහි ඇති පන්සල් ගණන හතළිහකි. ඒ අතර තිබෙන ස්වර්ණ විහාරය යුරෝපයේ විශාලතම පන්සල යි. එය විවෘත කළේ ස්ටාලින් බෞද්ධ විහාරස්ථාන වනසා කල්මික්වරුන් රටෙන් නෙරපීම සිහි කරමින් 2005 දෙසැම්බර් 27 වැනිදා ය. කිර්සාන් ජනාධිපතිවරයා බුද්ධාගම කෙරෙහි නැඹුරු වූයේ ළමා වියේ දී ය. ඔහු 2007 ජූලි 16 වැනි දින අල් ජසීරා රූපවාහිනියට ලබාදුන් සාකච්ඡාවකින් එය පැහැදිලි වෙයි. එය වෙබ් අඩවියෙන් නැරැඹිය හැකි ය. ඒ සාකච්ඡාවේ දී ඔහු මෙසේ කියයි. "මා හත් හැවිරිදි වියේ සිටින විට මගේ අත්තම්මා නිවසේ දොර ජනෙල් වසාගෙන බුදු හාමුදුරුවනට වැඳුම් පිදුම් කරනවා මා දුටුවා. මා ඇයගෙන් ඇහුවා ඇයි මෙහෙම රහසින් බුදුන් වඳින්නේ කියලා. කේ.ජී.බී. එක ඉන්නවා, සද්ද කරන්න එපා. නිදහසේ බුදුන් වඳින්න බැහැ. ඔබ ලොකු කෙනකු වුණාම මිනිසුනට එළිමහනේ නිදහසේ වැඳුම් පිදුම් කරන්න පන්සල් ගොඩක් හදන්න යැ යි අත්තම්මා මට කීවා. මා ඉටු කරන්නේ ඇයගේ උපදේශය යි. මා දැන් පන්සල් හතළිහක් හදලා තියෙනවා."

කල්මිකියාවේ සම්ප්‍රදායය අනුව විශිෂ්ට පුරවැසියකුට පිරිනමන උසස් ම ගෞරවය වන්නේ සුදු නෙළුම් ශ්‍රේණියට ඇතුළත් කරගැනීමයි. ජනාධිපති කිර්සාන් තම ආධ්‍යාත්මික ගුරුවරයා ලෙස සලකන දලයිලාමාතුමා සුදු නෙළුම් ශ්‍රේණියට පත් කරගෙන තිබේ. ජනාධිපති කිර්සාන් කඩිසර මිනිසෙකි. බොක්සිං ශූරයකු වන ඔහුට දිගු වේලාවක් එක තැනක නිකරුණේ රැඳී සිටීම අපහසු ය. "මම දිනකට පැය විස්සක් වැඩ කරන කෙනෙක්, නමුත් මගේ ඇතැම් රට වැසියන් හිතන්නේ ජනාධිපති කිර්සාන් සියලු දේවල් අපට නො මිලේ ලබාදෙයි. අපට තිබෙන්නේ කෑම හා නිදාගැනීම පමණ යි කියලා යි. එසේ සිතීම වැරැදි යි. අපේ රට දියුණු කරන්නට නම් අප කවුරුත් තදින් වැඩ කළ යුතු යි." ජනාධිපති කිර්සාන් පවසයි.

## මූලාශ්‍රය නාමාවලිය

**Temple "Golden adobe of Buddha Shakyamuni"**
Available at: http:// 10russia.ru/

**Buddhism in Kalmykia**. Available at: http://khurul/ru/

**Kalmyk Khanate** (second floor. XVII - 2nd floor. XVIII centuries) Cit. By: Historical Background of Addition of the Kalmyk Nation // Essays of the History of the Kanlmyk ASSR. Pre- October period.Moscow: Nauka, 1967
Available at: http:// ru.wikipedia.org/wiki/
Available at: http://www.tamqui.com/buddhaworld.